# ආලෝකයෙන් අඳුරට



සංස්කරණය

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**

# දිය සොයා යන පලුගස්වැව ජනතාව

**මේ දිනවල පවතින ඉඩෝරය නිසා දඹුල්ල, ගලේවල, හබරණ, සීගිරිය, නාවුල, පලුගස්වැව, ඇලහැර, විල්ගමුව, ලග්ගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට ජල හා ආහාර අර්බුදයකට මුහුණපා සිටිති.**



වර්ෂා ජලයෙන් ගොවිතැන් කරන ගොවීන්, කුලී වැඩ කරමින් ජීවත් වන්නන් ඇතුළු බහුතර ජනතාව ආහාර අර්බුදයකට මුහුණපා සිටිති. එම ජනතාව සිඳී ගිය වැව් වල ගඩොල් කැපීම, නෙළුම් අල ගැලවීම සහ සිඳී ගිය වැව් වල පණ අදිමින් සිටින මාළු ඇල්ලීම සිදුකරන අයුරුද දැක ගත හැකිය.

අහස් දියෙන් දියවර ලැබෙන වැව් සියල්ල සිඳීයෑම නිසා ළිංවල ජලයද සිඳී ගොසිනි. ජනතාව පානීය ජලය සොයා ගැනීමෙම් මෙන්ම දියනෑම සඳහාද ජලය සොයා දුර බැහැර යන බව කියති. ජනතාව මෙන්ම ජල හා ආහාර හිඟයෙන් සතා සිවුපාවුන්ද දැඩි ලෙස අසරණ වී සිටින අයුරු මෙම ප්‍රදේශ වල සංචාරය කිරීමේදී දැකගැනීමට හැකිවිණි.

සිඳීගිය වැව්වල ගඩොල් කපන ජනතාව කියා සිටියේ ගොවිතැනත් නොමැති නිසා කුලී වැඩත් නොමැති බවයි. කුලී වැඩක් නොමැති වූ විට මුදල් අඟහිඟකම් ඇති වන නිසා වැව් පිටියේ ගඩොල් කපා එක් ගඩොලක් රුපයිල් තුනට හතරට විකුණන් බවයි.

නෙළුම් අල ගලවන ජනතාව කියා සිටියේ පවුලේ කිහිප දෙනෙකුම එක්වී දවසට නොළුම් අල කිලෝ 10 ක් පමණ භාරා ගන්නා බවත්, ඉන් හවසට රුපියල් 300 ක් පමණ උපයා ගෙන දවසේ වියදම සරිකැර ගන්නා බවත්ය.

ජලය නොමැතිව කුඹුරු විනාශවී යන බවත් එළවළු කොරටු සියල්ල විනාශවී යෑම නිසා තමන් අසරණවී ඇති බවත් ගොවීහු කියති.

(දඹුල්ල - කාංචන කුමාර ආරියදාස)
21.07.2014 - ලංකාදීප

# ආලෝකයෙන් අඳුරට

## අංක : 19

සංස්කරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

**නමෝ තසස භගවතෝ අරහතෝ සමමා සම්බුද්ධසස !!!**

# "ශ්‍රද්ධාවන්ත පින්වතුනි"

පින්වත් ඔබට ඉදිරිපත් කරන මෙම දහම් ග්‍රන්ථයෙන් මා බලාපොරොත්තු වන්නේ අපට බොහෝ අවස්ථාවලදී දකින්නට ලැබෙනවා මරණාසන්නව අවසාන අවස්ථාවට එක්තැන් වූ පීඩාවට පත් අසරණ රෝගීන්ට ඔවුන්ගේ ඥාති හිතායිසීන් විසින් සංඝයා වහන්සේ නමක් හෝ කිහිප නමක් වඩම්මවා එම රෝගීන් ඉදිරියේ වඩා හිඳුවා සෙත් පිරිත් සජ්ජායනා කරවා පිරිත් පැන්, පිරිත් නූල් බැඳ බුදුගුණ පහදා දී ඔවුන්ගේ සිත් සතන් පහදා නික්ම ගිය පසු යම්කිසි අස්වැසිල්ලක් ලබන්නාසේ එදා බුදුරජාණන් වහන්සේ අනුගමනය කරණ ලද මට්ඨකුණ්ඩලී නම් සිටු පුතාට පිහිට වූ ආකාරය ආදර්ශයට ගනිමින් මෙම දහම් පොත ඔබ අතට පත් කරමි.

**නමෝ තසස භගවතෝ අරහතෝ සමමා සම්බුද්ධසස !!!**

තවද, අපගේ ස්වාමි දරුවාණන් වහන්සේ ලුම්බිණි වනොද්‍යානයෙහිදී මව්කුසින් බිහිවූ කල දෙවියන් බඹුන්ගේ මහත් බැතිබරින් හරසරින් පිළිගැනීමෙන් පසු මහා පෘතුවියෙන් මතුවූ රතු නෙළුම් මල් හතක් පිට ඉදිරියට වැඩකල සිංහ නාදයෙන් පසුව ශාක්‍ය, කෝලිය දෙනුවර එක්ලක්‍ෂ සැටදහසක් රජදරුවෝ මහත් වූ පෙරහැර කොට මහාමායා මවුබිසවත් කුමරුත් ආපසු කිඹුල්වත් පුරයටම වඩම්වා ගියහ.

තවද, වෙසතුරු ආත්ම භාවයෙහිදී මද්‍රිදේවී බෝසතාණන් වහන්සේ සමඟම සමවූ ආයුඃශ්‍රීත් රාජ්‍ය ශ්‍රීවිඳ එයින් සැව බෝසතුන් හා තුසීපුරයෙහි ඉපිද සත් පණස්කෙළ හැට ලක්‍ෂයක් අවුරුදු (පණස් හත් කෝටි හැට ලක්‍ෂයක් දිව්‍ය ආයුෂ මනුලොව අවුරුදු 400 ක් එහි

එක් දිනක්) මුළුල්ලෙහි බෝසත්ණන් වහන්සේටම අගමෙහෙසින්ව සිට දෙව් බඹුන්ගේ ආරාධනාව ඉවසා අවුත් සුද්ධොදන මහ රජතුමාට දාව මහාමායා දේවිය කුස පිළිසිඳගත් වේලෙහිම එම අගමෙහෙසින්වූ දිව්‍යාංගනාවෝද තුසීපුරයෙන් චුතව අවුත් දෙව්දහ නම් කෝලිය නුවර මහාමායා දේවියගේ අයියා වූ සුප්‍රබුද්ද රජතුමාට දාව අමිතා නම් බිසව කුස පිළිසිඳ බෝසතුන් මවු කුසින් බිහිවූ වෙසක් මස පුරපසලොස්වක්දා වීසා නැකතින් එතුමියද බිහිව යශෝධරා නමින් ප්‍රසිද්ධ වූහ.

එදා සුද්ධොදන රජතුමා මෙසේ සිතීය. මපුතණුවො මහා පිං ඇත්තාහ. එමනිසා මපුතණුවන් ඉපදුන නැකතේ තවත් එවැනි දරුවන් ඉපදී සිටිත්දැයි සිතා තෙසැටදහසක් රාජධානි පරීක්ෂාකර බැලීමේදී දැනගන්නට ලැබුනේ එම මොහොතේ එම නැකතේ ඉපදී තිබෙන්නේ යශෝධරා කුමරිය පමණක් බව දැනගත් සුද්ධෝදන මහ රජතුමා සතුටට පත්ව අපගේ රජකුල පරම්පරාවට ගැලපෙන දූ කුමරියක් පමණක් මෙම වේලාවට එම නැකතේම ඉපදී තිබෙන්නේ මාගේ පුත්‍ර රත්නය වෙනුවෙන්මයි. එම නිසා මාගේ පුත් කුමරුන්ට සේම එම දියණියටත් සියළුම ආරක්ෂාවත් කිරි අම්මාවරුන් ආදී මපුතණුවන්ට සේම සැප සම්පත් ලබාදී රැකගත්තේය.

## එකදා පහළවූ වස්තු හත

යශෝධරා කුමරිය, කන්ථක නම් අජාණීය අශ්වරාජයා, ඡන්න අමාත්‍යයා, ආනන්ද තෙරුන් වහන්සේ, කාළුදායි නම් අමාත්‍යයා, සතරමහා නිධානය, ශ්‍රී මහා බෝධීන් වහන්සේය. යන වස්තු හත බෝසත් කුමාරයා අන්තිමට උපන් ආත්ම භාවයේදී උපන් දිනම ලදහ.

## සතර මහ නිධාන

එම සතරමහ නිධානයන්ගෙන් ශංඛ නම් නිධානය වටින් ගවුවකි. (සැතපුම් 4 ක්) එල නම් නිධානය වටින් දෙගවුවකි. උත්එල නම් නිධානය වටින් ගවු තුනකි. පුණ්ඩරීක නම් නිධානය වටින් හතර ගවුවක් තැන ගැඹුරෙන් දෙලක්‍ෂ සතලිස් දහසක් යොදුන් මහ පොළොව හා සමාන ගැඹුර ඇත්තාහ. (යොදුන් සැතපුම් දහසයකි) එයින් එක නිධානයක ආවරණය ඇර එතුමාගේ නියෝගයෙන් මුළු ලෝ වැසියෝ කැමති කැමති රත්රුවන් ගත්තත් කිසිම අඩුවක් නම් නොවන්නේය. මෙය සතර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පිරුවාවු දාන පාරමිතා බලයයි.

## කාළදෙවල තාපසයා

තවද ඒ සුද්ධොදන රජතුමාගේ පියාණන් වූ ''සිංහහනු'' නම් රජතුමාගේ අග්‍ර පුරෝහිතවූ කාළදේවල නම් අමාත්‍යයො ශුද්ධෝදන රජතුමා කුඩා කල ශිල්ප උගන්වා පසුව පිය රජතුමාගේ මරණින් පසු සුද්ධොන රජතුමා රාජ්‍ය ශ්‍රී විදුනාකල තමන් දක රජතුමා ආදර දක්වන නිසා ගිහිගෙයි නොවසමි, යි තපස්දම් රකිමියි, අවසර ඉල්ලා සිටි අවස්ථාවේදී එසේ නම් මපියාණන් වහන්සේත් නැත ගුරුවූ ඔබ වහන්සේත් මගෙන් වෙන්ව දුර පළාතකට ගියොත් මට නිසි අවවාද දෙන්නට කෙනෙක් නැති නිසා මෙම උයනෙහිම වැඩසිට තපස්දම් රකිමින් මාගේ මාළිගාවෙන් දන්, පැන් ලබමින් මට අවවාද අනුශාසනා දෙමින් සිටින්නැයි, ඉල්ලා සිටිවිට එයට එකඟව රජ උයනෙහිම වාසය කළේය.

එසේ එම තපාස්වරතුමා භාවනානුයෝගීව කෙටි දිනකින් රූප විරාගය කොට අභිඥා ලැබ අතීතයෙන් මහා කල්ප හතලිහක්ද, අනාගතයෙහිත් එපමණම ප්‍රමාණයක් දැකීමෙ දිවැස් ලදසේක. මෙසේ ලබාගන්නා ලද

ධ්‍යාන බලයෙන් රජගෙයින් වළඳා රාත්‍රී උයනෙහි වාසය කර දිවා විවරණය සඳහා ඇතැම් දවසක නාග භවනයටද, තවත් දිනෙක ගරුඬ භවනයටද, තවත් දිනෙක අසුර භවනයටද, තවත් දිනෙක උතුරුකුරු දිවයිනටද, ඇතම් දිනෙක ශක්‍රදිව්‍ය රාජයාගේ නන්දන උයනෙහිද වැඩ වසති.

බෝසතාණන් වහන්සේගේ ප්‍රතිසන්ධි උත්පත්ති ආදී වූ දෙතිස් පූර්ව නිමිති පෙනෙන්නාවූ මහා මංගල කාලයෙහි ලෝකයෙහි යම්කිසි ඍෂිවරයෙක් ධ්‍යාන සුවයෙන් ඉඳීම අපගේ භාග්‍යවත් අභිත් සම්මා සම්බුදු රාජාණන් වහන්සේගේම එක්තරා අත්භූතවූ ධර්මතාවයක් හෙයින්ම එදවසද එම තාපසතුමා ජගෙයි දන් වළඳා දිවා විවරණය සඳහා තව්තිසා දිව්‍ය ලෝකයෙහි සක්දෙව් රජුගේ නන්දන උයනෙහි ධ්‍යාන සුවයෙන් උන්හ. එම අවස්ථාවේ දෙව්ලොව සිද්ධාර්ථ කුමාරොත්පත්තිය අසා දෙවියන්ගේ මහත් ප්‍රීති උත්සවයක් ඇතිවී තව්තිසා දෙව්ලොව එකම උත්සව ශාලාවක් බවට පත්විය. එවිට කාළදේවල තපස්වරින්තුමා ධ්‍යාන සුවයෙන් නැගී සිට දෙවියන්ගෙන් හේතු විමසීය. එවිට දෙවියන් සියලු විස්තර දන්වා සිටියාය. එවිට තපස්වරයාණන් එම ඇසිල්ලෙහිම දෙව්ලොවින් බැස රජමාළිගාවට ගොස් පණවන ලද ආසනය මත පලක් බැඳ උන්හ.

එවිට රජතුමා පැමිණ තාපසතුමාට වැඳ සිටි කල්හි, ''මහරජ තොපගේ දේවිය පුතකු ලදහයි ඇසීමි'' එම කුමරුන් දැකීම සඳහා මම මෙහි පැමිණියෙමි. යී කීහ රජතුමා මහත් සතුටට පත්ව ගෙට ගොස් ලක්ෂයක් වටිනා සළුවකින් තම පුතු පොරවා ''මපුතණුවනි, මෙම ස්වාමීන් වැඳ ආශිර්වාද කරගන්නැයි'' කියා කුමාරයන් තපස්වරයාණන් වෙත පෑහ. බුදුබවට පත්වන උත්තමයකුගේ අවසාන ආත්ම භාවයෙහි වැඳුම්, පිදුම් ගැනීමට සුදුස්සෙක් දෙවියන්, මරුන්, බඹුන් අතරද නැති නිසා එම අවස්ථාවේදී කාළදේවල තාපසතුමාටද හිඳි අස්නේ හිඳීමට නොහැකිව බිමට බැස්සාය. බුද්ධ තේජානුභාවයෙන් දෙසිරිපා එම

තාපසතුමාගේ හිස මුදුනෙහි පිහිටි සේක.

මෙය දුටු පියරජතුමා තම පුතු කෙරේ තිබූ ප්‍රේමය දරාගත නොහැකිව තම පුතුගේ කිරිකැටි සිරිපතුල් දෙක දෑතින් අල්ලා හිසමත තබාගෙන වැන්දේය. එවිට කාළදේවල තාපසයාද මේ මොන විශ්මිත වැඩක්ද, මෙතෙක් කල් මට දෙවියන්ද, බ්‍රහ්මයන්ද මාගේ දෙපතුල් අල්ලා වඳිද්දී මෙම කුඩා කුමරුගේ දෙපතුල මාගේ සිරස මත තබන්නට තරම් ඇති තේජස කුමක්දැයි විමසා බැලීම සඳහා කුමරුගේ සිරිපතුල් දෙක පරීක්ෂාකර බැලීමේදී දෙපතුල් පුරා තිබූ අටතුරා සීයයක් මඟුල් ලකුණු දැක දෙපතුල මැද පිහිටි සක් ලකුණු දෙක දැක ඉන්පසු තව දුරටත් පරීක්ෂාකර බැලීමේදී දෙසිය දහසක් මඟුල් ලකුණු බලා ඒකාන්තයෙන්ම මෙතුමා ලොවුතුරා බුද්ධත්වයට පත්වන උත්තමයකු බව දැන තවදුරටත් පරීක්ෂා කරනුයේ පාදයුගලයේ පටන් කේෂාන්තය දක්වාම බලනුයේ දෙතිස් මහ පුරුෂ ලක්‍ෂණයන් දැක, මෙතුමා ඒකාන්තයෙන්ම බුදුබවට පත්වන උත්තමයෙකු බව දැන මහත් සතුටට පත්ව තවදුරටත් පරීක්ෂාකර බැලීමේදී තුන්සිය විසි අටක් මංගල ලකුණු දැක ස්ථිරවම බුදුවන බව දැන මහත් සතුටට පත්ව තමන් පැවිද්දකු බවවත් අමතකව මහත් ප්‍රීතිඝෝෂා නගා සිනාසුනේය. ඉන්පසු මෙතුමා බුදුබවට පත්වන අවස්ථාව මට දැක ගැනීමට ලැබේදෝයි දිවැසින් බලා මෙම බුදුරජාණන් වහන්සේ නොව තවත් බුදුරජාණන් වහන්සේලා සියදහස් ගණනක් ලෝ පහළ වුවත් දැක ගැනීමට නොලැබෙන අහේතුක අරූප තලයෙහි උපදනා බව දැක මහත් වේදනාවෙන් අඬන්නට පටන් ගති.

තාපසතුමාගේ මෙම ක්‍රියාවන් බලා සිටි ඇමතියෝද, රජතුමාද මහත් දුකට පත්ව කුමාරයාට මතුවන අනතුරක් දැක අඬන්නට ඇතැයි සිතා ඒ ගැන තාපසතුමාගෙන් විමසීය. එවිට තාපසතුමා පැවසුවේ මෙම පින්වත් කුමරු මෙම ආත්ම භාවයේම සම්මා සම්බුඬත්වයට පත්වන බව දැන මහත් සතුටට පත්වුනෙමි. එනමුත් මෙතුමා බුඬත්වයට පත්වන විට මම මිය ගොස් මෙතුමාවන් බුදුරජාණන් වහන්සේලා දහස්

ගණනක් බුදුබවට පත්වුවත් සසරින් මිදීමක් නැති අහේතුක අරූපතලයෙහි ඉපිද අත ළඟ තිබෙන නිවන් සම්පත් අහිමිව සසර ගමන කවදා නිමා කර ගැනීමට ලැබේදෝයි මාහට මහත් දුක් වේදනාවක් ඇතිවූ නිසා එය වා වා ගැනීමට නොහැකිව ඇඬුනෙමි. මෙම කුමාරයාණන් වහන්සේට කිසිම අන්තරාවක්, උපද්‍රවයක් වන්නේ නැත. යි කියා නික්ම ගොස් මෙසේ සිතක් පහළ විය.

මට නොලැබෙන මෙම බුදුසසුන දැකීමත් සසර ගමන කෙටිකර ගැනීමත මාගේ ඥාතියෙකුට හෝ හිමිකර දිය යුතුයැයි සිතා ඒ සඳහා සුදුසු කෙනෙක් පරීක්ෂා කරනුයේ තමන්ගේ 'නාළක' නම් බෑණනුවන් කෙනෙක් සිටින බව දැක එකෙනෙහිම එම නුවර වසන තම නැගණියගේ නිවසට ගොස් නැගණිය අමතා තොපගේ පුතු ගෙනවයි කියා සිටි විට තම පුතු තාපසතුමා වෙත ඉදිරිපත් කල පසු දරුව, සුද්ධොදන රජතුමාට අද ලැබුණු පුත්‍ර රත්නය මෙයින් අවුරුදු තිස්පහක් ගෙවී ගිය පසු සම්මා සම්බුද්ධවයට පත්ව සංසාරගත සියලුම සත්වයා එම සසර දුකෙන් මුදවන්නේය. මට එම කුමාරයා බුදුබවට පත්වන අවස්ථාව වනවිට මාගේ ආයුෂ අවසන් වන්නේය. එමනිසා මට නොලැබෙන එම භාග්‍ය ලබාගැනීමට අවස්ථාව උදාවන්නේය. එමනිසා දැන්මම ගිහිගෙයින් නික්ම එම බුදුරජාණන් වහන්සේ වෙනුවෙන්ම පැවදිවෙව, යි දන්වා නික්ම ගියහ.

තාපසතුමාගේ බෑණනුවන් වූ නාළක කුමාරයන්ද පෙර පියුමතුරා බුදුසසුනෙහි නාළක නම් මොනෙය්‍ය පිළිවෙත් පුරන්නාවූ (එක් ගමක එක් දිනක් සිටීම සහ කථා නොකිරීම) භික්ෂූන් කෙනෙකු අග්‍රවූ සේ දැක මමද මතුලෝ පහළ වන බුදුරජාණන් වහන්සේ නමකගේ ශාසනයක නාළක නම් පිරිවෙත් පුරන්නාවුන් අතරින් අග්‍ර වේවා, යි ප්‍රාර්ථනා කර එතැන් පටන් එම බුදුසසුන තුල ආයු පමණින් පිංදහම් කර මහා කල්ප ලක්ෂයක් තුල දෙව්, මිනිස් සැප අනුභව කරමින් අවුත් තාපසතුමාගේ බස් ඇසීමත් සමඟ සියලුම බව භෝග සම්පත් අතහැර

සසර පුරුද්ද අනුව ඇවිත් මාගේ මාමණ්ඩි වූ තාපසතුමා පෙන්වාදුන්නේ යහපතක්මැයි සිතා බෝසත් කුමරු සිටි දිසාවට දොහොත් නමා වැඳ මතු බුදුවන උතුමාණනි, ඔබ වහන්සේ වෙනුවෙන්ම මම අද පටන් පැවිදි දිවි ගෙවමි, යි කියා ඉසකේ බා කශාවත් ඇඳ මැටි පාත්‍රයක් රැගෙන ගෙයින් නික්ම තපස්දම් පිරූහ.

එසේ මහණදම් පුරමින් සිටින අතර සිද්ධාර්ථ තාපසයාණන් වහන්සේ සම්මා සම්බුඬත්වයට පත්ව බරණැස ඉසිපතනාරාමයෙහි දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව කරන බව දැන හිමාල වනයෙහි සිට අවුත් බුදුරජාණන් වහන්සේගෙන් නාළක දම් පිළිවෙත් ඉගෙන ගෙන සත් මසක් රැකෂවූ එම පිළිවෙත් පුරා නැවත හිමාලයටම ගොස් භාවනායෝගීව සිට රහත් භාවයට පත්ව නිරුපාධිශේෂ නිර්වාන ධාතුවෙන් පිරිනිවි සේක.

තවද බෝධිසත්වයන් වහන්සේ උපන් පස්වන දවසේ නම් තබන මඟුල් දිනය දා රජමාළිගාව සුවඳ පැණින් පිරිසිඳු කොට සුවඳ වගී විසුරුවා මල්, බුලත් ගෙන වසුරුවා හිඳිනා ආසන පනවා චතුවේදයෙහි නිපුණ වූ බමුණන් ගෙන්වා පැන් නොදමා කිරෙන් සාදන ලද කිරිබත් රන්තළි වලට දමා ඒ සමඟම බමුණන්ට වෙනත් පඬුරු දී සත්කාර කොට මපුතණුවන්ගේ අනාවැකි ලකෂණ කියව, යි නියෝග කළහ. ඔවුන් අතරින් සැමටම ශිල්ප ශාස්ත්‍රය දුන් රාමය, ධජය, ලකෂණය, මන්තීය, කොණ්ඩඤ්ඤය, භොජය, සුයාමය, සුදත්ත කොඩඤ්ඤය යන මෙම බමුණන් අටදෙනා අතුරෙන් වැඩිමහල් සත්දෙනාම කුමරු පරීක්ෂාකර මේ කුමරු ගිහිගෙයි විසුවොත් චක්‍රවර්තී රජ බවට පත්වෙයි. පැවදි වූයේ නම් ඒකාන්තයෙන්ම සම්මා සම්බුඬත්වයට පත්වෙයි කියා ඇඟිලි දෙකක් ඔසවා ස්ථිර වචනයක් දීමට බැරි විය.

ඒ අතර ඔවුන් හත්දෙනාටම බාල සුදත්ත කොණ්ඩඤ්ඤ නම් බමුණු ආචාර්‍යතුමා ඌර්ණ ලෝම ධාතුව සුදු පැහැයෙන් දිස්වනු දැක. ඒකාන්තයෙන්ම බුදුවන උත්තමයන්ට පමණක් සුදු පැහැයෙන් ඌර්ණ ලෝම ධාතුව පිහිටයි. චක්‍රවර්තී රජ බවට පත්වන්නේනම් එම ලෝම ධාතුව රන්වන් පාටින් බබලයි. ඒ බව අවබෝධ කරගත් එම බමුණු ආචාර්‍යතුමා මෙකුමරු ඒකාන්තයෙන්ම ලොවුතුරා බුදුබවට පත්වන උත්තමයකුයැයි එක ඇඟිල්ලක් ඔසවා කීවේය. එම උත්සවය සහභාගී වූ බ්‍රාහ්මණයෝ මෙම පින්වත් උතුම් කුමාරයන් වහන්සේ සකළ සත්වයාටම සිද්ධාර්ථ කරයි තමාද සිද්ධාර්ථ කෙරෙයි කියා " **සිද්ධාර්ථ කුමාර** " යයි නම් තබා ගියහ.

## සුදත්ත කොණ්ඩඤ්ඤ

ඉන්පසු එම බමුණන් අටදෙනා තම තමන්ගේ නිවෙස් වලට ගොස් පුතුන් කැඳවා මෙසේ අවවාද දෙන්නට වූහ. "දරුවෙනි ශුද්ධොදන රජතුමාගේ පුත් සිද්ධාර්ථ කුමරුවෝ අද පටන් අවුරුදු තිස්පහක් ගෙවී ගිය පසු අභිත් සම්මා සම්බුඬ රාජ්‍යයට පත්වන්නේය. අප එතෙක් කල් ජීවත් නොවෙයි. එම නිසා තොප එම බුදුරජාණන් වහන්සේ වෙත පැවදිව මේ අති භයානක දුක් සංසාරයෙන් මිදෙවා යි අවවාද කර නොබෝ කලකින් බාලම බමුණු සුදත්ත කොණ්ඩඤ්ඤ පමණක් ඉතිරි වී අනෙක් සත්දෙනාම මිය පරලොව ගියහ.

ඉන්පසු එතුමා ගිහිගෙය හැරදමා තාපස වෙස් ගෙන දඹදිව සැරිසරන්නාවූ "උරුවෙලා" නම් දනව්වෙහි ඉසිපතනයට ගොස් එම ස්ථානය තපස්දම් රැකීමට යෝග්‍ය බැව් දැන සිඬාර්ථ කුමාරයානන් ගිහි ගෙයින් නික්මෙන තුරු මෙහිම තපස්දම් රකිමින් සිටින්නෙමි, යි සිතා එහි නතර වූහ. පසු කලකදී සිඬාර්ථ කුමරු ගිහිගෙයින් නික්ම තපස්දම් රැකීමට වනගත වූ බව දැන පෙරකී අනෙක් මියගිය බමුණන් සත්දෙනාගේ දරුවන් වෙත ගොස් තොපගේ පියාණන්ලා ජීවත්ව

සිටියෙහි නම් බෝසතාණන් වහන්සේ සමඟින්ම පැවදි වෙති. එමනිසා තොප කැමති නම් මා සමඟ එතුමා වෙනුවෙන් පැවදිවන්ට කැමති කෙනෙක් වෙත්නම් එන්නැයි පවසා සිටිවිට එයින් භද්දිය, වප්පය, මහානාමය, අස්සජීය යන හතරදෙනා එතුමා සමඟ ගොස් සිඬාර්ථ තාපසතුමා වෙනුවෙන් පැවිදි වූහ. පස්වග මහණුන්ගේ උත්පත්තිය කථාව මෙසේය.

ඉන්පසු බෝසත් කුමාරයාණන්ට නම් තබන දිනෙහි රැස්වූ අසූදහසක් කුල පරම්පරා නෑදෑයෝ මෙම කුමරු මතු චක්‍රවර්තී වූ නම් ක්ෂත්‍රිය සේනාවම පිරිවරා ඇවිදිති. එසේ නොමැතිව බුදුබවට පත්වුවහොත් එම සේනාවම පිරිවරා ඇවිදිති. මෙම හේතුවෙන් අපගේ දරුවන්ට මතු යහපතක්ම වෙතියි සිතා, රජතුමාටම දරුවන් භාරදී ගියහ. මෙසේ කුමරු සමඟ සපිරිවරින් වැඩෙන්නේය. කුමාරයාට අවුරුදු පහ පිරෙන විට සුද්ධොදන මහ රජතුමාගේ මහත් උත්සවශ්‍රියෙන් කෙරෙන වප්මඟුල් උත්සවයක් විය. එම අවස්ථාවට සහභාගි කරවාගෙන සිද්ධාර්ථ කුමරුද රංසිවිගෙයක තබා පෙරහරින් වඩමවා ඕවිටක් වැනි ස්ථානයක පිහිටි මහදඹ ගසක් මුල රජ උයනක් සේ සරසවා කුමරුට ආරක්ෂාව සපයා රජතුමාද නැකතට තම ඇමතියන් සමඟ සී සෑම පිණිස කුඹුරට බැස්සේය. ඒ සඳහා එක විට නඟුල් දහසක් පමණ යෙදවූහ. මෙම අතිමහත් උත්සවය බැලීම සඳහා කුමරුගේ ආරක්ෂාවට සිටි කිරිමවුවරුන්ද ආරක්ෂක තිරයෙන් පිටතට පැමිණියහ.

එවිට බුඬාන්කුරයාණන් වහන්සේ කිසිවෙකුත් පෙනෙන්නට නැති නිසා පලක් බැඳ වැඩසිටි ආනාපාන ස්මෘති භාවනා කොට ප්‍රතම ධ්‍යාන උපදවා ධ්‍යාන සුවයෙන් වැඩ උන්සේක. ඒ වේලෙහි කිරිමවුන් ඇතුලට අවුත් අහසෙහි වැඩහුන් කුමරු දැක දඹ ගසේ සෙවනැල්ලද හිරුගේ ගමන අනුව සෙවනැල්ල වෙනස් නොවී කුමරුට මුතු කුඩයක් සේ සෙවන දෙමින් සිටිනු දැක රජතුමා වෙත දිව ගොස් එපවත් සැළකර

සිටියේය. රජතුමා එය ඇසූ සැණින් කරසිටි සියළු කාර්‍යයන් පසෙක දමා කුමරු වෙත දිව ආවේය. ඒ අනුව සියළුම දෙනාද රජතුමා පසුපස දිව ආහ. රජතුමා දඹ ගසේ උපහාරය දැක මවිතයට පත්ව කුමරු වැඩසිටි ස්ථානයට ගොස් බලන විට මහ තෙරනමක් ධර්මාසනයක වැඩසිටින ආකාරයට මේ පස්වස් කුමරයා අහසේ පලක් බැඳ ධ්‍යාන සුවයෙන් හිඳිනු දැක මවිතයට පත්ව දරාගත නොහැකි පුත්‍ර ස්නේහයෙන් ''මපුතණුවනි, මෙය මොන ආශ්චර්‍යක්ද, ඔබ දැන්මම බුද්ධත්වයට පැමිණි යේද, ඔබගේ මෑණියන් වහන්සේ සිටියාණන් එම මෑණියන්ට ඇතිවන සතුට මම කෙසේ පවසන්නද? මා එකලා පියෙක් හට මෙසේ වූ සුරතල් කුමට පාන්නෙහිද?'' යි කියමින් රජතුමා අඬ අඬා තම පුතුගේ සිරිපතුල් යුගමය දෑතින් අල්ලා තම හිසමත තබා වඳින්නට වූහ. ඒ අනුව රැස්ව සිටි සියල්ලෝම ජීවමාන බුදුරජාණන් වහන්සේට වඳින ආකාරයට වන්දනා මාන කරන ලදී.

## පියරජතුමා කුමාරයන් ගිහි බන්ධනයෙන් තබා ගැනීම.

මෙසේ සම්පත් විඳිමින් වැඩනෙ කුමරුගේ වයස අවුරුදු 16 ක් වයස්ගත විය. රජතුමා බමුණන් ගෙන්වා මපුතුණුවන් කිනම් හේතුවක් නිසා තපසට යයිද? යි විමසීය. එවිට බමුණන් පවසනුයේ ''කුමාරයන් වහන්සේ ජරාරූපයක් දැකීමෙන්ද, රෝගියෙකු දැකීමෙන්ද, මළ සිරුරක් දැකීමෙන්ද, මහණ රුවක් දැකීමෙන්ද සසර කළකිරී රජසැප හැරදමා වනගතව තපස්දම් රැක ඉහත සඳහන් දුක්ඛයන්ගෙන් මිදීමට වෙර දරති'' යි පැවසූහ. රජතුමා එබස් අසා ''චක්‍රවර්ති රජකම ලැබීමට හේතුව සහ තිබෙන මපුතණුවන්ට වනගත වී දුක්විඳ බුදුවනවාට වඩා චක්‍රවර්ති රජකම ලැබීම සුදුසුයි කියාද, බුදුවන අවස්ථාවේ අති භියකරු යක්ෂ සේනාවක් වටකරගන්නා අවස්ථාවේ සියළුම දෙවියෝද, බ්‍රහ්මයෝද බියෙන් හිස් ලූ ලූ අත දුවද්දී මපුතණුවන් පමණක් එම යකුන්ට මැදිවන්නට ඉඩ නොතබමියි'' යි සිතා සියළුම ඇමතියෝ කැඳවා අද පටන් මපුතණුවන්ට ජරා, ව්‍යාධි, මරණ, රුවක් දක්නට ඉඩ

නොතබන්නැයි දන්වා සිටිමින්ම දන්මම මපුතණුවන් කාම බන්ධනයෙන් ගැටගසමි, යි සිතා තුන් සෘතුවට සරිලන සියළු සැප සම්පත් වලින් පරිපූර්ණ මාළිගා තුනක්ද, එහි සේවය සඳහා මුළු දඹදිවටම සිටි රූමත් කාන්තාවන් පමණක් යෙදවීමෙන්ද, පුතණුවන් උපන් නැකතින්ම එම මොහොතේම උපන් පින්වත් යශෝධරා කුමරිය වෙත සිත යොමා තම පුතුට යශෝධරා කුමරිය සරණ පාවා දීමට කැමති බව එතුමියගේ පිය රජතුමා වන සුප්‍රබුද්ධ රජතුමා වෙත් දූතයන් යැවූහ.

එම දූතයන් අමතා සුප්‍රබුද්ධ රජතුමා මෙසේ පවසා යවූහ. ඔබගේ පුතණුවන් කෙටි කාලයකදී රජකම හැරදමා මහනවීම සඳහා වනගත වන මම දනිමි. ඉන්පසු මාගේ දූ කුමාරි වැන්දඹු වෙති. එවන් කෙනෙකුට මාගේ දියණිය සරණපාවා නොදෙමි. සුදුස්සෙකුට පාවා දෙමියි දන්වා යැවූහ. සිද්ධාර්ථ කුමාරයා එපවත් අසා ''මහණත් වෙමි, යශෝධරා මට පාවා නොදෙතොත් රාජ්‍යය මට නොකැමැත්තේය'' යි කියති. යශෝධරා දේවියද ''සිද්ධාර්ථ කුමාරයෝ හෙට මහණ වෙතත් සරණ රැකෙත් නම් ඔහු කෙරේම රැකෙම්ම'' යි කියති. සුද්ධෝන රජතුමා මේ දෙදෙනාගේ එපවත් අසා තමන් ශාක්‍ය කුලයට අධිපති බැවිනුත්, නැගණිය බිහිකල දියණියගෙනුත් නෑකම් පෙන්වා කැමති කරවා මහ පෙරහරින් යශෝධරා කුමරිය ගෙන්වා රුවන් මත සිටවා සරණ පාවාදී දෙදෙනාටම ඔටුනු පළඳවා රාජ්‍යයත් පාවාදී අග මෙහෙසි තනතුරද දුන්හ.

මේ අතර සුද්ධෝදන රජතුමා යශෝධරා කුමරිය තම පුතුට සරණ පාවාදීමට සුප්‍රබුද්ධ රජතුමාගේ කැමැත්ත ලැබූ පසු ඒ බව තම ශාක්‍ය - කෝළිය නෑ හිතමිතුරන්ට දන්වා යැවීය. එවිට එම නෑයෝ එයට අකමැත්ත වශයෙන් සිද්ධාර්ථ කුමරුගේ අඩු වයසත්, ළඳ බොළඳ බවත්, මේ දක්වා කිසිම ශිල්ප ශාස්ත්‍රයක් හදාරා නැති බවත්, රජකෙනෙක් වූවොත් සතුරු බලවේගක් පැමිණි විට එයට මහුණ දීම

සඳහා කිසිම යුද්ධ ශිල්පයක්වත් නොදත් කෙනෙකුට මෙවන් උතුම් කුළ කුමරියක් සරණපාවදී පසුව එතුමිය අතරමංවන බවත් කියා එයට අකමැත්ත ප්‍රකාශ කර සිටියේය. මේ බැව් දැනගත් සිදුහත් කුමරු මාගේ බලපරාක්‍රමය මොවුන්ට පෙන්වමි, යි සිතා ''මාගේ යුධ ශිල්ප දකින්නට කැමති කෙනෙක් මෙයින් සත්වන දවස මාගේ උයනට රැස්වන්න, යි නුවර පුරා ප්‍රචාරය කර හැරියේය.

එසේ ප්‍රචාරය කර යවා රාජාංගනයෙහි එක් ලක්‍ෂ හැටදහසක් ඥාතීන්ට පහසුකම් ඇති විශාල කූඩාරම් සාදවා තවත් විශාල සෙනඟ සඳහා පහසුකම් සලසා ඒ මධ්‍යයෙහි දහසක් යෝධයන්ට පරිහරණය කිරීමටත් අපහසු දුන්නක් සාදවා ගෙන්වාගෙන එම දුන්නේ එක් කෙළෙවරක් බිම තබා වම් පාදයේ මහපටගිල්ලෙන් පාලනය කර වම් අතින් දුන්න අමෝරා දකුණු අතින් එක්වර ඊතල දහස් ගණනක් මහත් ශබ්ද නගා කිසිවෙකුටත් අනතුරක් නොවී ඉවතට විදින ලදී. එයින් නිකුත් වූ ශබ්දය අකුණු ගැසීමක් හා සමාන වූහ. කුමරු අවතක්සේරු කල ඥාතීහු මහත් ලජ්ජාවටත්, කම්පණයටත් පත්වූහ. පසුව ඔවුන් විසින්ම මෙසේ පවසන ලදී. අපගේ සිද්ධාර්ථ කුමරු මනුෂ්‍යයෙක් නොව මහත් බලපාරක්‍රම ඇති දෙවියෙක්ම විය යුතුය, යි කියා මහත් සතුටට පත්ව සිටියදී මාගේ අනෙකුත් ශිල්පත් මොවුන්ට පෙන්විය යුතුයැයි සිතා සියළුම ජ්‍යොතිෂ, වෛද්‍ය, අක්‍ෂරය, ගණිතය ආදී මෙකී නොකී සූ සැට ශිල්ප ශාස්ත්‍රයම කිසිම ගුරුවරයකුගේ මඟ පෙන්වීමක් නොමැතිව දැක්වූයේය.

මෙයාකාරයට අති මහත් මවිත වන යුධ ශිල්ප ආදී අනේක ප්‍රකාර ශිල්ප ශාස්ත්‍ර පෙන්වා අවසානයේදී කුමරුන් ගැන අවතක්සේරුවට සිතූ ඥාතීහු තම තම නිවෙස් වලින් එක් එක් කුමාරිකාව බැගින් මනා ලෙස සරසා අගමෙහෙසිය වූ යශෝධරා දේවිය ප්‍රධාන කොට හතලිස් දහසක් කුළ කුමරියෝ ශාක්‍ය-කෝළිය වංශිකයන්ගෙන් සරණ පාවා දුන්හ.දෙවඟනන් සමාන රූප ශෝභාවෙන් යුත් එම කුළ කුමරියන් සමඟ පියරජතුමා සාදවා දුන්

තුන් සෘතුවට සරිලන මාළිගා තුනේ අපමණ රජ සැප සම්පත් විඳිමින් කාලය ගෙවන අතර එක් දිනක් කුමරුට උයන් කෙළි සඳහා යාමට සිත් වී ඒ බැව් රථාචාර්‍ය්‍යයාට දන්වා සුදුසු වාහනයක් සූදානම් කරන්නැයි දැන්වූ සේක.

නියෝගය අනුව මනා රථයක් ඉතා අගනා සුදු පැහැති අශ්වයන් හතර දෙදෙකු යොදවා කුමරුට දන්වා සිටියේය. මේ අතර දෙවියන් රැස්ව කුමරුන්ට බුදුවන්නට කාලය ලංවන නිසා අප දැන්මම තපසට උවමනා පසුබිම සකසමුයි කියා එක් දිව්‍ය පුත්‍රයෙක් ඒ සඳහා යොදවා කුමරු උයන් කෙළි යන අතරමඟ කුමරුට පෙණෙන ලෙස මහත් අපහසුවෙන් හැරමිටියෙන් යන මහළු වෙසක් මවා පෑවේය. එම ජරා මහළු මිනිසා කුමරුටත් රථාචාර්‍ය්‍යයාටත් පමණක් පෙනෙයි. වෙනත් කිසිවෙකුටත් නොපෙනෙයි. ඒ දුටු කුමරු රථය නවතා සියළු තොරතුරු රථාචාර්‍ය්‍යයාගෙන් දැන ''මෙම ජරා තත්වය මටත් ඇති වේනම් එම ජීවිතයට, ආත්මයට ශාප වේවා'' යි කියා ගමන නවතා ආපසු මාළිගාවට පැමිණ කළකිරීමෙන් සිටි සේක. ඒ දැනගත් පිය රජතුමා ඇමතියන් කැඳවා එවන් මිනිසෙකු ඉදිරියට දෙගව්වක් දුරට අනෙකුත් කළකිරෙන අසාධ්‍ය රෝගීන්, මළමිනි නොපෙනෙන ලෙසට වගබලා ගන්නැයි කියා පුතුට තව තවත් කාමබන්ධනයට යොමුවීමට තව තවත් සැප සම්පත් වැඩි කළේය.

නැවත මාස හතරක් ගෙවී ගිය පසු නැවතත් උයන් කෙළි යාමට සිත්වී ඒබැව් රථාචාර්‍ය්‍යයාට දැන්වීය. පෙරසේම මනා අලංකාර රථයක් සූදානම්කර සුදු අශ්වයින් හතර දෙනෙකු යොදවා පෙරහරින් උයනට යන මඟ දැඩි මුරකාරවල් යොදා කුමරුගේ සිත කළකිරෙන දර්ශන දැකීමෙන් වළක්වා ගැනීම සඳහා පිය රජතුමා මහත් වෙහෙසක් ගත්තත් දෙවියන් අවශ්‍ය වේලාවට, අවශ්‍ය ආකාරයට, සුදුසු ස්ථානයෙහිදී දෙවන වරටත් ඉතා අප්‍රසන්න රෝගී මුනුෂ්‍යකු මවා පෙන්වූහ. කුමරු පෙරසේම විස්තර අසා දැන මටත් එවන් තත්වයක් වේනම් මෙම ආත්ම

භාවයට ශාපවේවායි, කියා ආපසු මාළිගාවට පැමිණ කළකිරීමෙන් සිටින බැව් දැනගත් පියරජතුමා දෙගව් තුන්ගව් දක්වා ආරක්ෂා කර තව තවත් කාමසම්පත් හිමිකරදී තාවකාලික අස්වැසුවත් නැවත සාරමාසයක් ගෙවීගිය පසු උයන් කෙළි ගමන පිටත් වූහ.

රාජ භටයෝ ජීවිතය පරදුවට තබා කුමාරයාණන්ට සතර පෙරනිමිති පෙනෙන්ට ඉඩ නොතැබුවත් දෙවියන්ගේ රාජකාරිය නියමිත වේලාවට අකුරටම ඉටුකරති. පියරජතුමාත් රාජභටයෝත් කළකිරෙති. කුමරු සතර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරා එන බලාපොරොත්තුව අධිෂ්ඨානය කරා පාරමිතා බලයෙන් බාධාවන් ඉවත්කර දෙයි. නැවතද අවශ්‍ය ස්ථානයෙහිදි අවසන් කටයුතු සඳහා ගෙනයන මළ මිණියක් කුමරුගේත් රථාචාර්යාවරයාගේත් නෙත් වලට දර්ශනය වෙති. රථාචාර්යතුමාගෙන් විස්තර අසාදැන කළකිරීමට පත්ව උයන් කෙළි ගමන නවතා ආපසු මාළිගාවටම යයි. පියරජතුමාත් ඉදිරියේදීවත් තම පුතුට දුක් දෙන වනාන්තර ගතවන පැවිදි භාවයෙන් වළක්වා චක්‍රවර්තී රජකම ලබාදීමට මහත් වෙහෙසක් දරා කටයුතු කලත්, දෙවියන්ගේ දේවානුභාවයෙන් පියරජතුමාගේ බලාපොරොත්තු ඉටු නොවෙයි. කුමරුගේ සංසාරිකව බලාපොරොත්තු අරමුණ කරා ලඟා වෙයි.

නැවත නැවතත් සාරමායක් ගෙවී ගිය පසු නැවතත් සිද්ධාර්ථ කුමාරයාණන් වහන්සේට උයන් කෙළි යාමට අවශ්‍ය වෙයි. රාජභටයෝ තව තවත් මුරකපොලු තරකරමින් දැඩි සෝදිසියෙන් යුතුව සිටිති. ඒ අතර පිය රජතුමාගේ අවධානයද පෙරට වඩා දැඩි විමසිල්ලෙන් බලා සිටියි. හතරවන වතාවටත් උයන් කෙලි ගමන සඳහා කුමරු සපිරිවරින් උත්සවශ්‍රීයෙන් යුතුව නික්මෙති. නියමිත ස්ථානයෙහිදී ආරක්ෂක භටයන්ට නොපෙනේ. කුමාරයණ් වහන්සේට සහ රථාචාර්යාන්ට පමණක් පෙනේ. ඉතා ශාන්ත ගමනින් යුතුව වඩින හිස්, රැවුල් බාගත් කාශාවත් වස්ත්‍ර හැඳ පොරොවාගෙන පාත්තරය උරහිසේ රඳවාගත්

උත්තමයෙක් ඉතා සන්වරව ගමන් කරනු දකී. එවිට කුමරුගේ අණපරිදි රථය එදෙසට යොමු කරයි. කුමාරයා එතුමාගෙන් කරුණු විමසයි. කුමරුට මෙපමණ කලක් වැසී තිබුණු නිවන් දොරටුවේ ආරම්භයත් මුලින් කළකිරීමට හේතු කරණාවූ සිද්ධීන් වලින් මිදීමටත් උපාය මාර්ගය අවබෝධ වූ සේක.

නමුත් එදා උයන් කෙළි සඳහා ගියේය. එසේ ගොස් දවස පුරා උයන් කෙළි කරමින් සිසිල් පැන් ජලයෙහි ක්‍රීඩා කරමින් එදින එහි ගතකර ආපසු මාළිගාවට ඒමට පෙර රාජාභරණයෙන් සැරසීමට සළුපිළි වස්ත්‍ර රාජාභරණ, මිණි, මුතුවැල් රැගෙන රාජ සේවකයින් කුමරු පිරිවරා ගත්හ. මේ අතර ශක්‍රදේවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය රත්විය. එවිට සක්දෙව්රජ පරීක්ෂා කරනුයේ බෝසතාණන් වහන්සෙ මහණ වනදා අවසාන අලංකාරය නිසා විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා යහළුව, සිද්ධාර්ථ කුමාරයෝ අද මධ්‍යම රාත්‍රියෙහි මහභිණික්මන් කොට හෙට අළුයම් වේලෙහි පැවිදි වෙති. එමනිසා මෙය එතුමාගේ අවසාන රාජ්‍ය ශ්‍රී රූපයෙන් බැබලීමයි. ඔබ වහාම එතනට ගොස් කුමරු දිව්‍යාභරණයෙන් සරසන්නැයි දන්වා සිටියහ. ඒසමඟම විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා රජකුමරු සරසන ස්ථානයේ සිටි පිරිවෙර ප්‍රධානියාගේ වේශයෙන් පෙනී සිටිමින් එම් කර්‍යයෙහි යොදුනාහ. පළමුවෙන්ම කපුවා අත තිබූ වෙළුම් සළුවගෙන සිරස වෙළීය. ඒවේලෙහි බෝසත් කුමරුට මෙය මිනිස් අතක් නොව දිව්‍ය අතක් බව දැනුනි. මොහු මිනිස් රූපයෙන් පෙනී සිටින දෙවියෙක් බව වැටහුණේය. එම දිව්‍ය පුත්‍රයාද ශාක්‍ය දිව්‍ය කුමාරයෙක් සේ බැබලීමට කුමරුව සැරසුවේය.

එදා බෝසතාණන් වහන්සේ මහණ වන දිනට පෙර දින විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් කරන ලද අලංකාරය එදා පටන් අද දක්වාම පැවිදි භාවය ලබන අයට උරුම දායාදයක් වශයෙන් තවදුරටත් පවත්වාගෙන යති. මෙසේ ඉතා අලංකාරයට මහෙශාක්‍ය දිව්‍යපුත්‍රයෙක්

ලෙසට සැරසී සිටි කුමරුට තූර්‍ය්‍යනාද පවත්වා රැස්වසිටි පිරිසගේ ප්‍රීතා ඝෝෂා මධ්‍යයේ සරසන ලද අගනා රථයට නැගී ආසානාරූඪ වූහ. එකෙනෙහි යශෝධරා තම අගබිසව කුසින් පින්වත් පුත්‍ර රත්නයක් බිහිකළහ. එබැව් දැනගත් සුද්ධොදන රජතුමා මහත් සතුටට පත්ව මාගේ යෙහෙළිය පුත් රුවනක් ලදහ, යි මපුතණුවන් දරුහිමි පියකු කරවා මහණදමට යාම වළක්වා ගැනීමට මෙයත් මහත් උපකාරයක් යයි සිතා බමුණන් කැදවා මඟුල් වෙස් ගෙන ගොස් මපුතණුවන්ට මෙම සුභ ආරන්චිය දෙවා යි, කියා පිටත්කර යවා සිද්ධාර්ථ කුමරුට ඒ බැව් දැන්වූ පසු රාහුලයෙක් ඉපදුනි. ඒ මට ගිහි බන්ධනයෙකි, යි කී සේක. ඒ අනුව කුඩා කුමරුට "රාහුල" නාමය යෙදූහ.

ඉන්පසු බොසතාණන් වහන්සේ මෙසේ සිතීය. මිනිස් ලොව උපන්නෙකු හට දරු සම්පතක් ලැබීම නම් ඉතා දුලීභයි, දරු සම්පතකින් පුත්‍ර රත්නයක් ලැබීම එයටත් වඩා දුලීභයි. එමනිසා මෙම මොහොතේ මහණ වන්නට නොගොස් මාළිගාවට ගොස් මපුතු දැක මධ්‍යම රාත්‍රියෙහි මහබිණික්මන් කරමි, යි සිතා චක්‍රවර්තී රජකෙනෙකුගේ ලීලාවෙන් නුවරට ඇතුල්ව එන අතරමඟ හරස්කර කිසාගෝතමී නම් කුමාරිකාවක් මෙසේ කීවේය.

**නිබ්බුතා නූනසා මාතා - නිබ්බුතා නූන සො පිතා**
**නිබ්බුතා නූනසා නාරි - යස්සායං ඊදිසො පතී -යි**

එහි අදහස - රූප ශොභාවෙන් බබලන්නාවූ කුමරුනි, ඔබගේ මෑණියන්ගේ සිත නිවී ගියේය. ඔබගේ පියාගේ සිතද නිවී ගියේය. යම් ස්ත්‍රියක් ඔබගේ රූපයේ පහස ගත්තානම් එම ස්ත්‍රියද නිවී ගියේය.

බෝසත් කුමරු ඇසූ නිවී ගියේය කියන වචනය අනුව මමද නිවී යායුතුයි, නිවන සෙවිය යුතුයි, මැය මට ඉතා මිහිරි වදනක් කීවේය, යි සතුටට පත්ව ගෙලබැඳි ලක්‍ෂයක් වටිනා මුතු මාලය ඇයට දුන්නේය. එම අගනා මාලය ලද ඇය කුමාරයෝ මටත් යශෝධරාවන්ට වාගේ ආලයක් ඇතිකර ගත්තායි සතුටට පත්විය.

ඉන්පසු සිද්ධාර්ථ කුමාරයාණන් වහන්සේ මාළිගාවට ඇතුල්ව ශ්‍රී යහනාවෙයි සැතපුන සේක. ඒ සමඟින්ම සුවඳ, තෙල්, පහන් ආලෝකය රජමැදු පුරාම දල්වූහ. එවිටම අන්තඃපුර කාන්තාවන් කුමාරයාණන් වටා එක්රොක් වෙමින් කණ්ඩායම් වශයෙන් ගීත ගායනයට, රඟපෑමට, වාදනයට පටන් ගත්හ. කුමාරයාණන් වහන්සේ මේ සියල්ලන්ම පිළිකුල්කර ඒදෙස නොබලා සැතපෙන්නට වූහ. එවිට එම රූප සුන්දරියන් කුමාරයාණන් සැතපෙද්දී අපේ රඟපෑන් කාට පේන්නදැයි කියා උන් සිටි - සිටි තැන්වලම ඒ මේ අත වැතිර නිදන්ට වූහ. සැමටම නින්ද ගිය පසු කුමරු අවදිව බලන විට සුවඳ පහන් ආලෝකයෙන් රඟමඩලම බැබලෙමින් තිබියදී මොහොතකට පෙර නටපු, ගී කියපු, වාදනය කරපු රූමත් ස්ත්‍රීන් දත් කුණු කෙළ පෙරමින්, දත්කුරු කමින්ද, විකාර දොඩවමින්ද, අඩ නිවීසත්‍රයෙන්ද, මළමිනී සෙයින්ද තැන් තැන්වල සිටිනු දැක තව තවත් කළකිරීමට පත්ව මෙම දෙතිස් කුණපයන් සසර වසන සත්වයාට මහත් උපද්‍රවයක් සේ සිතා මෙම පිළිකුල් කාමබන්ධනයෙන් ඉක්මණින් මිදෙමි, යි සිතා දෙපා සද්ද නොවන සේ එම ස්ථානයෙන් ඉවත්වූ සේක.

ඉවතට ගිය කුමරුට යමෙක් නිදා සිටිනු දැක ඔබ කව්දැයි විමසූ විට, ''ස්වාමීනි, මම ඡන්න'' යයි කීවේය. ''ඡන්නය, මට ඉක්මණින්ම මහබිණික්මන් කිරීමට අවශ්‍යයි. කිසිවෙකුටත් නොදැනෙන්න සුදුසු අශ්වයෙක් ගෙන එව'' යි කීසේක. ''යහපති,''ස්වාමීනි, කියා දහස් ගණන් අසුන් සිටි අස්හලට ගොස් පරීක්‍ෂා කිරීමේදී ''කන්ථක'' නම් අජානීය අස්වයා දැක (එකදා පහළවූ වස්තු හතෙන් එක් වස්තුවක්)

මොහු තමයි සුදුසු යයි සිතා කුමරු වෙනුවෙන් අසු සරසන්ට වූහ. එවිට අශ්වයා මෙසේ සිතන්නට විය. වෙනදා නැති විශේෂ වෙනස් ආකාරයෙන් සරසන්නේ මා පමණයි. උයන් කෙළි සඳහා සතර දෙනා බැඟින් සැරසූහ. මාගේ ප්‍රාර්ථනාව ඉෂ්ඨ වෙන්නයි එන්නේ, මාගේ ස්වාමීයා අභිනිෂ්ක්‍රමනය කරනුයේ මාගේ පිටින්ම යයි මහත් සතුටට පත්ව සතුටු ශබ්දයක් කළහ. දෙවියන් එම ශබ්දය කිසිවෙකුටත් නොඇසෙන සේ සැඟවූහ.

ඉන්පසු බෝධි සත්වයෝ ඡන්න ඇමති නවතා, මපුතණුවන් බලා එමි, යි කියා යශෝධරා දේවියගේ ශ්‍රී යහන් මාළිගාවට ගොස් සෙමෙන්, සෙමෙන් දොර විවෘත කර දෙපා සද්ද නොගැනෙන සේ බලා සිට සංසාරයේ අපමණ කාලාන්තරයක් එකටම පාරමීදම් පුරමින් එම පාරමීදම් පිරීමට සහාය දීමෙන්ද, සෙවනැල්ලක් සේ පැමිණි යශෝධරා දේවියත්, වෙස්සන්තර ආත්ම භාවය ඇතුළු අනන්ත අප්‍රමාණ ආත්ම භාවයන්හිදී පියාට කීකරුව ආ පුත්‍ර රත්නයත් සුවසේ සැතපෙනු දැක් මහත් සංවේගයක් සිතට ගලා ආවත්, දේවිය අවදි වූවහොත් මාගේ ගමනට බාධාවක් වන නිසා මෙම දෙදෙනෙක් නිසා මෙවන් අනන්ත අප්‍රමාණ සත්ව සංහිතියක් භව දුකෙන් මුදවා අපත් දුක් සංසාරයෙන් මිදෙමු, යයි සිත එකඟ කරගෙන ගමනට නික්මුණු සේක.

ඉන්පසු බෝසතාණන් වහන්සේ අසුවෙත පැමිණි ''මාගේ මිත්‍ර කන්ථක'' කියා අසුගේ පිටට අත තබා අද රෑ පහන්වීමට ප්‍රථම මෙහි සිටින කිසිවෙකුටත් නොදැනෙන සේ මම බලාපොරොත්තු වන ස්ථානයට නිරුපද්දිත රැගෙන යව, එහිදී මා සම්මා සම්බුද්ධත්වයට පැමිණ තොප ඇතුළු සියළු සත්ව සංහිතියම සසර දුකෙන් මුදවමි. යි පවසා අසු පිටට නැග්ගේය. ඡන්න ඇමතියාද පසු පසින් අසු පිටට නැගුනි. එම අශ්ව රාජයාගේ ග්‍රීවය පටන් වාලධිය දක්වා අටළොස් රියන් දිග ඇත්තේය. දිගට සුදුසු උසද ඇත්තේය. පියකරු සුදු පාටින් බබලන්නේය.

බෝසතාණන් වහන්සේ අසුපිට නැගී රජවාසලේ මහ දොරටුව වෙත පැමිණියේය. අසුගේ පා තබන ශබ්දය පිටතට නොඇසෙන සේ දෙවියෝ නිශ්ශබ්ද කළහ. මේ අතර පිය රජතුමා විසින් මපුතණුවන් අපට නොදැනෙන ලෙසට අවේලාවක මාළිගාවෙන් පිටවීම වැළැක්වීම පිණිස මිනිසුන් විශාල පිරිසක් යොදවා ක්‍රියාකරන ගේට්ටුවක් ප්‍රධාන දොරටුවට යොදවන ලදී. එවන්ම පිරිසක් මුරකාවල් සඳහා යොදවන ලදී. බෝධිසත්වයන් වහන්සේ බොහෝ සේ කාය බල ශක්තියෙන්ද යුක්තය. සසරදී කරන ලද පාරමීදම් බලයෙන් යෝධබල ශක්තියක් උපතින්ම ලබන ලදී. එමනිසා මහදොර විවෘත නොවූවහොත් ඡන්නයාට අශ්වයා බදාගෙන අල්ලන්නට කියා මාගේ කාය ශක්ති බලයෙන් අසු අල්ලාගෙන මහ දොරෙන් එළියට පණිමි, යි සිතා ගත්සේක.

ඡන්න ඇමතියාත් මෙසේ සිතීය, යම් හෙයකින් දොර විවෘත නොවූයෙනම් මාගේ ස්වාමියා දකුණු දසරුවෙහි හිඳුවාගෙන අශ්වයා වම් අතට ගෙන පවුර පැන මාගේ ස්වාමි දරුවන් නිරුපද්දිතව මම අවශ්‍ය තැනට ගෙනයමි, යි සිතුහ.

කන්ථක නම් අශ්වරාජයත් මෙසේ සිතීය. දොරටුව විවෘත නොවේනම්, ඇමතියාත් මාගේ පිටෙ එසේම සිටියදී, මාගේ යුතුකම මාගේ ස්වාමියාගේ අපේක්ෂාව ඉෂ්ඨ සිද්ධ කර දීමයි. එය එසේ හෙයින් මාගේ ස්වාමියා නිරුපද්දිතව මෙම මහදොරටුවෙන් එළියට පණිමියි, යම් හෙයකින් දොර විවෘත නොවූවහොත් තුන්දෙනාම වෙන වෙනම සිතපු ආකාරයට ක්‍රියාකිරීමේ ශක්තිය , බලය, ආරක්ෂාව නුවණ ඔවුන් සතු විය.

එසැණින් වාසලට අධිගෘහිත දෙවියන් දොර විවෘත කර දුන්නේය. එය දුටු වසවර්තී මාර දිව්‍ය පුත්‍රයා සිද්ධාර්ථ කුමරු මෙතනින් නික්ම ගියොත්, ඒකාන්තයෙන්ම බුදු වෙනවාමයි.එසේ වුවහොත් මා

හට වන්නේ බලවත් පාඩුවක් මාගේ අපායන් හිස්වෙයි, දිව්‍ය ලෝක පිරෙයි, ආපායන් වලට එළිය ලබාදෙයි. එසේ හෙයින් කෙසේ හෝ මොහු යන ගමන නවතා දැමිය යුතුයැයි සිතා, කුමරු ඉදිරියේ පෙනී සිටිමින්,

**මා නික්ඛම මහාවීර - ඉතොතෙ සත්තමෙ දිනෙ**
**දිබ්බනතු චක්ක රතනං - අඩා පාතු භවස්සති - යි**

" මහා වීරයාණෙනි, ඔය ගමන නවතින්න, අදින් දින හතක් ගෙවී ගිය පසු ඔබට චක්‍රවර්ථී රුවණ පහළ වෙයි. සතර මහා දිවයිනටම අධිපතිව දෙදහසක් ජනපදවලින් පිරුණාවූ මේ මහා පෘතුවියටම ඔබගේ අඥාව පතුරවා චක්‍රවර්ති සම්පත් විඳින්න. ඔය යන ගමන ඔබට පීඩායි, කටුකයි, එමනිසා ඔහොම නවතින්න" යි කීවේය. එවිට අපමහ බෝසතාණන් වහන්සේ අහසෙ පෙනී සිටි දිව්‍ය පුත්‍රයා දැක "තොප කවරෙක්දැයි " යි විචාළ සේක. එවිට මාර දිව්‍ය පුත්‍රයා තමා එසේ මෙසේ කෙනෙක් නොව සියළුම කාමසම්පත් වලින් අධිකව හයවන දිව්‍ය ලෝකය වන පරනිම්මිත වසවර්ථී දිව්‍ය ලෝකයේ අධිපති වසවර්ථී මාරදිව්‍ය පුත්‍රයා වෙමි. මා කියන්නක් අසව කියන්නක් කරවායි කීහ.

එවිට බෝසතාණන් වහන්සේ මෙසේ වදාළ සේක. " තොප වැනි මාරයන් සිය දහස් ගණනක් අවුත් මගේ ගමන වළකාලන්නට උත්සහ කළත් එය කළ නොහැක. තොපට වඩා චක්‍රවර්ති රජකම ලැබෙන බව මම දනිමි, ඒනිසා තගේ උපදෙස් මට අවශ්‍ය නැතැයි" වදාළ සේක. මෙසේද වදාළ සේක. " දස දහස් සක්වල ගුගුරුවා සම්මා සම්බුද්ධ රාජ්‍යයට පත්ව දම්සක් පවත්වමි, මට තා වැනි පාපියෙකුගෙ උපදෙස් වලින් හා තර්ජන වලින්............? තෝ මෙතැන නොසිට පලායව" යි නැවතත් තර්ජන කළ සේක.

එවිට මාරයා ලජ්ජාවටත්, කෝපයටත් පත්ව, " තා බුදුවන හැටි මා බලමි, මෙතැන් පටන් තට කාමවිතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක්

හෝ විහිංසා විතර්කයක් හෝ තා සිතපු විටෙක තට කරන දේ මම දනිමි.'' යි කියා එතැන් පටන් සය අවුරුද්දක් මුළුල්ලේ ඉතා සුළු වරදක් හෝ සොයමින් බෝසතාණන් වහන්සේ පසුපසම සෙවණැල්ලක් සේම සිටියේය. එයින් නොනැවතී බුදුවන දවස මුළු සක්වලම ඒකාකාර භිය ජනක දර්ශනයෙන්ද, ශබ්දයන්ගෙන්ද, මහත් යක්ෂ සේනාවන්ගෙන්ද, තර්ජන, ගර්ජන කලත් මාරයාට අවස්ථාවක් නොලැබුණි.

මෙසේ වසවර්ති මාරයාට තර්ජනය කර අභියෝග කර සියළුම රාජසම්පත් අළුයම කටින් පිටකරන කුණු කෙළ පිඩක් සේ ප්‍රතික්ෂපකර මහත් ගාම්භීරත්වයෙන් යුතුව නුවරින් පිටත්වූ සේක. එදා ඇසල මස පුන් පොහෝදා උතුරුසල නැකතින් මධ්‍යම රාත්‍රියෙහි මහබිණික්මන් කොට නුවර බලනු කැමතිව ආපසු හැරී බැලීමේදී එකෙණිහ මහ පොළව කුඹල් සකස් සේ පෙරළී බෝසතාණන් වහන්සේට අත්ලපිට තිබෙන දෙයක් සේ මුළු නුවරම දර්ශණය විය. නුවර බැලූ ස්ථානය '' කන්ථක නිවත්ත'' නම් මතු චෛත්‍යක් ඉදිවන්නේය, යි සළකුණු දී වඩනා මඟී මුඛයට අශ්වරාජයා මෙහයවා ගමන් ගත්සේක.

එම අවස්ථාවෙහි දස දහසක් සක්වල කාමාවචර දෙවියෝ අපගේ ස්වාමියා ගමන් කරන මඟීය ආලෝකමත් කරවිය යුතුයැයි සිතා එම මාර්ගයේ පෙරට සැට දහසක්ද, පසුපසට සැටදහසක්ද බැගින් පහන් ආලෝකමත් කරමින් මහත් පුද සත්කාරයෙන් ශබ්ද කළහ. එම ආලෝකයෙන් ඉතා කුඩා කුහුඹුවන් පවා දර්ශණය වේ. මෙයාකාරයට සෙසු දෙවියෝද, නාගයෝද, ගරුඩයෝද, ගාන්ධර්වයෝද මල්, පහන්, සුවඳින් පූජා කරන්නට වූහ. තවද, පඤ්චාංගික තූර්යගෙන දිව ආ ගාන්ධර්ව දෙවියෝ හැම දිසාවේම එකම ශබ්දයෙන් තූර්යවාදන පූජාවන් කළහ.

මෙසේ දස දහස් සක්වල දෙවියන් කරන මහත්වූ පූජාවන් විඳින්නාවූ බෝධිසත්වයන් වහන්සේ එදා රෑ තිබූ පසළොස් පැය

දැතුරෙහි තුන් රටක් ගෙවා තිස් යොදුනක් ගොස් අනෝමා නදී තෙරට අළුයම් කාලයෙහි පැමිණි සේක. එම අශ්වරාජයාගේ ජවය එපමණදැයි සිතතොත් නිදහසේ දිවීමට ඉඩලදොත් සතිස් ලක්ෂ දස දහසක් යොදුන් සක්වලගබ සිසාරා බමරෙක් නැටුවා සේ ඇසිල්ලකින් දිව ගොස් දහවල් බතට වාසස්ථානයට එනතරම් ජව බල ඇත්තේය. එදා මඟ දිගට දෙවියන්ගේ නොයකුත් පුද පූජාවන්ද, දණමඬලක් උසට පරසතු මල් ආදී අනෙකවිද මල් වලින් පිරීතිබීමද තම ස්වාමියාට දෙවියන්ගේ වන්දනමාන වලට අවස්ථාව දීමේ උවමනාවද අවබෝධ කරගෙන මෙපමණ වේලාවක් ගමන නිම කිරීමට ගතවිය.

ගං තෙර අසුන් නවතා මේ කිනම් ගංගාවක් දැයි ඡන්න ඇමතිගෙන් විමසූ පසු මේ ''අනෝමා'' ගඟ යයි කීහ. ''මාගේ පැවිද්දත් අනෝම, අලාමකය'' යි ගඟෙ නම අසා සතුටට පත්ව අශ්වයාට ගඟින් එතරට පණින්න විළුඹින් සංඥා කළ සේක. අශ්වයාද තම ස්වාමියාට මෙවන් සේවයක් කිරීමට තමන්ට ලැබීමේ මහත් සතුටට පත්ව රියන් අටසියයක් පළල ගඟින් තම ස්වාමියාද, ඡන්න ඇමතියාද සමඟින් ගඟින් එතරට පැන්හ.

ඉන්පසු කුමරු අසුපිටින් බැස ඡන්න ඇමතියා අමතා ''යහළු ඡන්නය, ඔබ මාගේ රාජාභරණත්, අශ්වයාත් රැගෙන ගොස් මපියාණන්ගේ ශෝකය දුරු කරව, කුඩා මෑණියන්ගේ ශෝකය දුරු කරව, යශෝධරාවන්ගේ ශෝකය දුරු කරව, මපියාණන්ට මා වෙනුවට මාගේ රාහුල පුතාගේ සුරතල් බලන්ට කියව, එසේම මම ලොවුතුරා බුදුබවට පත්ව එන බව කියව, සතුටින් සිටින බවත් කියව, පැවදි වූ බවත් කියව, මෙම රාජාභරණ දැකීමෙන් ඔවුන් එය පිළිගනිති. එමනිසා මා වෙනුවෙනුත් ඔවුන් වෙනුවෙනුත් තොප එම යුතුකම ඉටුකරනුයි'' අවවාද දුන් සේක. එසේ අවවාද කිරීමට හේතුව කුමරු තනිකර ආපසු යාමට ඔහුගේ බලවත් අකැමැත්ත නිසයි. අකමැත්තෙන් නමුත් කුමරු තනිකර යාමට එම යුතුකම් වෙනුවෙන් සිදුවිය.

මෙය අසාසිට අශ්වයාටද, එය මැනවින් තේරුම් ගොස් තම ස්වාමියාගෙන් වෙන්වීමේ දුක ඉවසාගත නොහැකිව සිරිපා යුග්මය ඉඹ ආපසු යාමට සූදානම් උවත් දුක වා වා ගත නොහැකිව ළය පුපුරා එම ස්ථානයෙහිම මැරී තව්තිසා දෙව්ලොව එම නමින්ම උපන්හ. ඡන්න ඇමතිගේ තිබුණ දුක් වේදනාවට සිත්තැවුලට තවත් දරාගත නොහැකි වේදනාවක් වූයේ කන්ථක අසුගේ මරණයයි. තම ස්වාමියාගේ වගකීම ඉටුකිරීමේ වගකීම උඩ සිත එක්ලස් කරගෙන මහත් සිත් වේදනාවෙන් නමුත් ස්වාමියාගේ සිරිපා වැඳ සමාවගෙන යුතුකම නිසාම ආපසු මාළිගාවට ගොස් රාජාභරණ පෙන්වා කුමරු පැවිදි වූ නියාවත්, බුදුබව ලබා ආපසු එන බවත්, සනීපෙන් සිටින බවත් දන්වා කාගේත් සිත්තැවුල් සංසිඳුවේය.

## ඡන්න ඇමතිගේ අතීත ප්‍රාර්ථනාව

මතු ලොව පහළවන බුදුරජාණන් වහන්සේ නමකගේ බුදුවන ආත්ම භාවයේ කාමබන්ධනයෙන් මුදවා ගැනීමට අනුබල වෙමි, යි මහා කල්ප ලක්ෂයක් පුරණ ලද ප්‍රාර්ථනා ඇති උතුමෙකි. එම කල්ප ලක්ෂයන් අනෙක් සියළුම කල්ප පසෙක තබා මෙම මහා භද්‍ර කල්පයෙහි පමණක් අප මහ බෝසතාණන් වහන්සේ වෙනුවෙන් පමණක් කරන ලද පාරමී ධර්මයන් මෙසේයි.

සවණ්මුග ජාතකයෙහි රන්වන් මුව රජ ව ඉපිද මළපුඩුවකට අසුවී සිටිනු දැක මහත් ආදර ගෞරවයෙන් එම මළපුඩුවෙන් නිදහස් කර යැවුවේය. තවද, රොහත්ත නම් මෘග ජාතියෙහි එම නමින් ඉපිද පෙරසේම මළබැඳී සිටිනු දැක නිදහස් කර යවන ලදී. තවද, සාලිකේදාර ජාතකයෙහිදී ගිරා රජව උපන් සමයෙහි කුඹුරක අටවා තිබූ මළපුඩුවක සිරවී සිටියදී නිදහස් කර යැවුවේය. ස්වණ් මයුර ජාතකයෙහිදී රන්වන් මොණරව දණ්ඩකීහිරඤ්ඤ නම් පර්වතයෙහි වාසය කොට අවුරුදු හයසීයයක් ගිය පසු මළපුඩුවකට අසුවී මහත් වේදනාවෙන් සිටිනු දැක

එයින්ද නිදහස් කර යවන ලදී. චුල්ල හංස ජාතකයෙහිදී ශ්වෙත හංස රාජව උපන් කල්හි එයින්ද නිදහස් කරන ලදී. තවද, මෙම චන්න ඇමතියා මහා හංස ජාතකයෙහිදී මම හංස රාජයෙක්ව ඉපදී සිටියදීද මළපුඩුවකට අසුව සිටිනු දැක එයින්ද නිදහස් කර හරින ලදී. මෙලෙස සසර ජාති සහ සහස්‍රයෙහි නොයෙක් බන්ධනයන්ගෙන් මාව මුදවාලී ආකාරයට මෙම අවසාන ආත්ම භාවයෙන්ද කාමබන්ධනයෙන් මුදවා ලීය. මෙලෙස කල්ප ලක්ෂයක් පුරා මම ප්‍රාර්ථනා කරගෙන ආ නිසා ඔහු අස්වසා ඔහුට තිබූ වගකීම පවරා මම තොප පසුව මහණ කරමි, යි සනසා මාගේ පියරජතුමා වෙත යැවීමි.

**මේ පූජාවලිය පොත් වහන්සේගේ අප භාග්‍යවතුන් වහන්සේ පැවදි වන දා ලද ''මහාබිණික්මන් පූජා කථා'' නම් වූ දසවන පරිච්ඡේදයෙත්, එයටම අදාළ කොටසක් වූ ඡන්න ඇමති ගැන සඳහන් 11 වන පරිච්ඡේදයේ පළමුවන කොටසත් ආශ්‍රිත්‍රයෙන් සම්පාදනය කලෙමි.**

## පසුවදන

මෙම දහම් ග්‍රන්ථය සම්පාදනය කරන ලද්දේ ක්‍රිඃවෂී 2008 ඔක්තොබර් මාසයේදීය. මේ වන විට අවුරුදු හතක් ගෙවී තිබේ. මෙපමණ කාලයක් මුද්‍රණය කිරීමට අනුග්‍රහයක් නැති නිසා යටපත්වී තිබී එයට අවස්ථාවක් ලද නිසා අවසාන පිටු 2 ට ඡායාරූප හතරකුත් 21.07.2014 දින ලංකාදීප පුවත්පතේ පළවී තිබුණු එම ලිපියත් එය මාතෘකා කර කෙටි ධර්මදේශනාවකුත් පහත පළ කරමි. පුවත් වාර්තා 2 ක් එක සමාන නිසා එක වාර්ථාවක් පමණක් පොතට ඇතුලත් කරමි.

**ඉත්ථීධුත්තො සුරාධුත්තො - අක්ඛධුත්තො ච යො නරෝ**
**ලද්ධං ලද්ධං විනාසෙති - තං පරාභවතො මුඛං**

ඉහත සඳහන් ගාථා පාඨය පිරිවාණ පොත් වහන්සේගේ පරාභව සූත්‍රයෙහි 8 වන පිරිහීමේ දොරටුවයි. එම පිරිත් සූත්‍ර දේශනාවේ පිරිහීමේ මාර්ග 12 ක් පෙන්වා වදාළ සේක. එයින් 8 වන පිරිහීමේ දොරටුව අදාල ඡායාරූප 4 ක් මාවෙත ලැබී මෙම ගාථා පාඨය (අවවාදය) නොසලකා හරින මිනිසුන්ට මෙලොව, පරලොව නිමක් නැති දුක් කන්දරාවකට සහ නිමක් නැති කාලපරිච්ඡේදයක් සතර අපාගත වීමට හේතු කාරණා මදක් මෙයින් පෙන්වා දෙමි.

**<u>ගථාවේ තේරුම -</u>** අධික කාමරාගයන් හේතු කොටගෙන පර ස්ත්‍රී පුරුෂ සේවනය සහ සුරාවට හා සූදුවට වහල් වීමේ විපාකයි මෙයින් පෙන්වා දෙන්නේ. පළමු කොට පුවත්පත් වාර්තාව කියවන්න, දෙවනුව ඡායාරූප දෙස සිත යොමු කරන්න.

සම්බුද්ධ ශාසනයක් පවත්නා කාලයක බුදු සසුනේ භාණ්ඩාගාරය වූ මේ ශ්‍රී ලංකාද්වීපයේ බෞඩයන්ට අත්වී තිබෙන ඉරණමක තරම ඉතා මෑතදී සව් ආගමික උත්සවයකදී ක්‍රිස්තියානි පියතුමෙක් කියා තිබුණා ශ්‍රී ලංකාවේ බෞඩයෝ ඉතා අසරණ දුප්පතුන් කියා. මමද එම කියමන එසේම පිළිගනිමි. ස්ථිර කරමි. ඇයි ? මෙසේ වන්නේ පසෙනදි කොසොල් රජතුමාගේ සිහින 16 න් එකක තිබෙනවා කළියුගයයෙහි (වර්ථමාන) කාන්තාවන් පිරිසක් එක්ව ලිපක් සාදා ලොකු මුට්ටියක බතක් උයන සැටි. එම ලිපේ තුන් පැත්තෙන්ම සමව ගින්දර දැල්වෙන ආකාරයත්, බත හැන්දෙන් හොඳට කුරු ගා තැම්බුවත් අවසානයේ බතේ එක් කොටසක් බෙරි වී තිබීමද, තව කොටසක් ඇට්ටකුණා වී තිබීමද, අනෙක් කොටස ආහාරයට සුදුසු ආකාරයට තැම්බී තිබීමද මෙම සිහිනයෙන් රජතුමා දුටුවේය.

පසුවදා මල්ලිකා දේවියත් සමඟින් කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් සිහිනයේ අර්ථ කථනය ඇසූ අවස්ථාවේදී අපගේ භාග්‍යවතුන් වහන්සේ එයට මෙසේ අර්ථ කථනය දී වදාල සේක. මෙම සිහිනයේ විපාක ඔබතුමාට හෝ ඔබතුමාගේ රාජ්‍යයට වන විපතක් නොව කලියුගෙහි පහළවන අධාර්මික රජදරුවන් සහ නිලධාරීන් නිසා පස් පව්, දස අකුසල්, නොකටයුතු වෙළඳාම් සහ මිනිසුන් ගුණ ධර්මයෙන් පිරිහීමත්, ආත්මාර්ථකාමී වීමත්, පාපයට ලජ්ජා - නැති වීමත් හේතු කොට ගෙන නොයෙක් ආකාරයේ දුශ්චරිත හේතුවෙන්, වායුව විෂම භාවයට පත්වෙයි. ලෝක පාලක දෙවියෝ, ශාසන ආරක්‍ෂක දෙවියෝ කළකිරීමට පත්ව ඉවත බලයි. වෘක්‍ෂලතාදියට අධිගෘහිත දෙවියෝද මිනිසුන්ගේ ආරක්‍ෂාවට සිටින දෙවියෝද කළකිරීමට පත්ව ඉවත බලයි. එවිට රියදුරෙක් නොමැතිව මාර්ගයක ගමන් කරන වාහනයක තත්වයට ලෝකය පත්වෙයි.

එකී හේතු කාරණා නිසා නිසිකලට වැසි නොලැබෙයි. වැසි බලාපොරොත්තු ප්‍රදේශ වලට පායයි. පැවිල්ල අවශ්‍ය ප්‍රදේශ වලට

වසියි. එයද සිදුවන්නේ වැසි නිසා ගොවිතැන් බත් විනාශ වීම, ගං වතුර පීඩා සහ විනාශය හා ආහාර හිඟය, ලෙඩ රෝග බහුලවීම, ආර්ථික පරිහානිය හා වැසි නොලැබෙන ප්‍රදේශ වලට පුවත්පතේ වාර්ථාව අනුව සිදුවීම. එය බත් හැළියේ එක කොටසක් බෙරිවී තිබීමත් තව කොටසක් ඇට්ටකුණා වී තිබීමත් අනෙක් කොටස මෙකී හේතු දෙකෙන්ම ආරක්ෂා වී තබීමත්ය සිහිනයේ තේරුමයි.

ඡායාරූප සහ ගථාවේ අර්ථකතනය

## අසබ දූතෙතා (සූදුව)

මෙම ඡායාරූප හතරෙන්ම පෙන්වන්නේ සූදුවට ඇබ්බැහි වීමේ විපාකයි.

**<u>එනම්</u>** - ඉන්මනින් දියුණුවීමේ නොහොත් අහසේ මාළිගා සෑදීමේ බලාපොරොත්තු තබා තමා උපයන ධනය කෙළෙහිගුණ සැලකීම, යුතුකම, චාරිත්‍ර වෙනුවෙන් නොයොදා ලොතරැයි, වැඩි ලාභ, පොලියට දීම, ආදියට යෙදවීම නිසා පිරිහීමයි.

**<u>කළගුණ සැළකීම</u>** - මළගිය ඥාති, හිතයිෂි වෙනුවෙන් පින් අනුමෝදනා නොකර පසුවට කල් දැමීම සහ ජීවත්ව සිටින දුගී අසරණයන්ට පිහිට නොවීම සහ පුණ්‍ය කටයුතු වලින් වැළකීම ආනාගතයෙහි එන ප්‍රශ්න නොසලකා හැරීම ආදිය.

## යුතුකම්

ලෝකපාලක - ශාසන ආරක්ෂක - තමන්ගේ ඉෂ්ඨ දෙවියන්ට සොබා දහමට ගරු නොකිරීම සාසනික යුතුකම් ඉටු නොකිරීම.

## චාරිත්‍ර

සුදුවට ඇබ්බැහි වීමෙන් පවුල් ඇතුලත, පිටත අඬ දඹර, ඊෂ්‍යා, ක්‍රොධ ඇතිකර ගැනීම, සිත දූෂිත වීමෙන් පිරිහීම වේ. මෙකී නොකී කරුණු කාරනා නිසා **"තංහායො ජායතී සොකො"** නිසා කුසල් සිත් වෙනුවට අකුසල් සිත් නිසාත් පෙර පිණ මෙලොව පින මඳ නිසා අසරණ තත්වයට පත්වීම. එයින් ජීවත්වීමේ සටන වෙනුවෙන් සහ ධර්ම ඥාණය නැති කමින් නැවත පාපයට යොමුවීමෙන් සතර අපා අටමහනිරයන්ට වැටීම.

## සුරා ධුතෙතා

පස්වන සිල්පදය බීඩියෙන් ආරම්භවූ සුරාව අද වන විට ගංජා, අභින්, හෙරොයින්, පෙති වර්ග, එන්නත් වලින් තවතවත් ඉදිරියට ඒමෙන් බුද්ධ දේශනාවේ සඳහන් වන ආකාරයට පරමායුෂ අවුරුදු සියයෙන් පහතට බසිත්, බසිත්ම උන්මත්තකයින් බවට පත්වන්නේ මෘර්ගෙෂන් වර්ෂාව වස්වා මෙම අතුරුකප සත්‍ර විනාශයෙන් අවසන් කර ඊ ළඟ අතුරුකල්පය ආරම්භ කිරීම සඳහාය. මෙම මත්වතුර අද වන විට සිංහල බෞඬ නිවෙස් වල උත්සවයන් සඳහා අත්‍යාවශ්‍ය දෙයක් බවට පත්වී තිබේ. එහිදී නොබොන අයට බොන දෙයකට නොදැනෙන්න මිශ්‍රකර දෙනු ලැබේ. තවද ගමන් යාමේදී අතරමඟ හමුවන මිතුරු වේශයෙන් පෙනී සිටින යකුන්, යක්ෂණියන් විසින්ද මදන මෝදක වාගේ දේවල් රවට්ටා දී කරන අපරාධ වලට දඬුවම් නැත්තේ පාලකයෝත් ඔවුන්ගේ බලය පමණක් ආරක්ෂා කරගැනීමට මාන බලන නිසාය. එය එසේමය.

## ඉදිරි දුතො

මෙම තුන්වන සිල්පදය නිසා අද මහ පොළොව පවා ඔරොත්තු නොදෙන පොළොව පලා අපාගතවන පාපකර්මයන් උනත් අතීතයේදී එවන් දරුණු අපරාධ වලදී එසේ වූයේ එවන් අපරාධයක් සිදුවූයේ බොහෝ කාලයකට වරක් වගේ නිසාත් දැන් වර්තමානයේ පරමායුෂ අපුරුදු හැත්තෑපහකට පමණ පවතින නිසාය. එමනිසා තව ඉදිරියේදී දැන් සිදුවන අපරාධ වලටත් වඩා අපරාධ සිදුකරන අය ප්‍රභූ තත්වයට පත්වේ. විශේෂයෙන් මව පියා මරණ සමාජයේ වැඩි වැඩියෙන්ම අපරාධ කරන තැනැත්තා මුළු දිවයිනටම සාමදාන විනිසුරු බවට පත් වෙයි. එය අභාග්‍යයක් නොව අභාග්‍ය යුගයක් අවසන් කිරීමේ පෙරනිමිතිය. ඒ බැව් වටහාගෙන මෙයින් මිදීම සඳහා වහ වහා කුසල් දහම් වල යෙදී පස් පවෙන් වැළකී පිංදහම් කර ගැනීමයි.

## ඡායාරූප අංක (1)

මේ අහිංසක දරුවා දෙස බලන්න. ළමා වයසේ කෙළි සෙල්ලම් වයස පින්වත් භූමියේ පාපයෙන් වැළකී කුසගින්න නිවා ගැනීම සඳහා නෙළුම් අල දෝතක් තබාගෙන ඉන්නේ කව්රු නඩත්තු කරන්නද ? දරුවාගේ අනාගතය අඳුරුය. ''ආලෝකයෙන් අඳුරට'' යන උත්පත්තියක් දැයි සැක සිතේ.

ඡායාරූප අංක (4)

පෙරකී ඡායාරූපයෙන් පෙන්වාදෙන අනෙක් පැත්තය. අඳුරෙන් අඳුරටම යන ජීවිතයකි. ජලයේ ඉපදී වැඩී ජීවත්වන මත්ස්‍යයා කිරට, මිරිසට, කටට රසට, ඇඟට ගුණට, අතමිට සරු කරන දෙවියන් පණ දුන් (ගෝවා ගෙඩිය) නෙළුම් අලය අංක එකේ ඡායාරූපයත් අංක හතර ඡායාරූපයත් බලා වෙනස වටහා ගන්න. මෙකී ළමයාත්, වැඩිමහල්

පියාත් ඒ දෙදෙනාටම වඩා තිරිසන් අපායේ ඉපිද (මත්ෂායයා) සා පිපාසාවෙන් අනේක දුක් විඳ මිනිසත් ආත්ම භාවයේ සිටියදී අනුන්ගේ කාපු මාළු වලට ණය ගෙවීමයි කරන්නේ. සූදුවෙන් පැරදුනා, මතෙන් මත්වුණා, පරලොව වශයෙන් කිසිවක් කර කියා ගන්න බැරි උනා, අවසානයේ බුද්ධ ශාසනයෙන් පිහිට ගන්න බැරි උනා. දුකට පත්වන ආත්ම භාවයක ඉපදුනා පරලොව වශයෙන් කෙසේ වෙයිද ? තුන්වන ඡායාරූපයෙන් පෙන්වන්නේ හතර වතාවක් ගොවිතැන් කර වගා හානියට පත්ව වස පානය කළ පියකු සහ දියණියකු පිළිබඳ කථා පුවතකි.

**ධර්මය ජීවමානයි. එව බලව, අවබෝධ කර ගැනීමට වාසනාව නැත.** වාසනාව උරගා බලන්නේ ලොතරැයි ටිකට් පතිනි. වර්ථමානයේ ටිකට් අලෙවිපත් කරන්නේ සීයයට හැටක් පමණ අංගවිකල, මන්ධ බුද්ධික අයයි. ඔවුන්ගේ තෘෂ්ණාවන් දෙකක් තිබේ. එකක් ටිකට් පතෙන් ලැබෙන කොමිස් මුදල, අනෙක අපෙන් කාට හෝ ලොකු මුදලක් ඇදුනොත් ඔවුන් පසුපස ගොස් කුට්ටියක් කඩා ගැනීමයි. අන්තිමේදී නටපු තොවිලයකුත් නෑ බෙරේ පලුවකුත් නෑ සූදුවෙන් අන්‍යයන්ගේ රු. 20/- කඩා ගැනීමේ පාපය වශයෙන් ස්වභාව ධර්මයෙන් දෙන දඬුවම්ය. අවාසනාවේ මහත තව තවත් සිත් ඇදීයන්නේ එවන් දේ සඳහාමය.

## <u>සුරාව, සූදුව, ගණිකා වෘත්තිය</u>

මත් ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදාහැරීම, පාවිච්චි කිරීම, නොයෙකුත් ආකාරයේ සූදුවන් පවත්වාගෙන යාම සඳහා බොරුව, කපටිකම, වංචාව උඩ අන්සතු වස්තුව ගෙන රජයේ දේපල තමන්ගේ බූදලය ලෙස ගැනීම, මෙම ඡායාරූප වලින් පෙන්වන අයවන් අසහනයට පත්වන අයගේ දේපල තුට්ටු දෙකට ගෙන, ගිනි පොළියට ගෙවා ගත නොහැකි කොන්දේසි මත පොළියට, කුලියට මුදල් දී ඒ අසරණයන්ව තව තවත් පීඩාවට පත්කිරීමේ කර්ම විපාක වශයෙන් දුඃඛ නියත් පවතින

ප්‍රදේශවල සතා සිවුපාවන්ව ඉපිද, ජලජ ප්‍රාණීන් වශයෙන් ඉපිද, වැදි, කෙවුලන්ගේ ගොදුරු බවට පත්වන්නේ සහ ඔවුන්ට රැවටෙන අය වශයෙන් ඉපදින්නේ මෙකී පවුකාර මනුෂයන්ම බව වටහා ගන්න.

<u>**ඡායාරූප අංක (2)**</u>

දසදෙනෙකු සිටින පවුලක එම දසදෙනාම නෙළුම් අල කිලෝ දහයක් සොයා රු. 300/- ට විකුණන්නේත් එවන් මුදලක් හෝ ලැබෙන්නත් පිණ මඳ නිසාමය. මේවා තේරුම්ගෙන ජීවිතය යහමඟට ගන්න. තාවකාලික ජීවත පැවැත්මක් වෙනුවෙන් පාපකර්මයන්ගෙන් වළකින්න. මේවාට බොහෝ සෙයින් ගොදුරු වන්නේ සිංහල බෞඩයොමයි, ඔවුන් දුකට දමන්න මංගල යෝජනා, විදේශ රැකියා ආදී අතරමඟ හමුවන වංචාකාරයන් සහ ඊටත් වඩා භයානක සත්ගුණවත් නෝනාමහත්වරුන් ලෙස පෙනී සිටින යක්ෂණියන්ට රැවටෙන්න එපා.

**තෙරුවන් සරණයි !**

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ගුණරත්න යෝගාශ්‍රමය,
ගෝනවල,
කැළණිය.
27.10.2015
(වස් පවාරණ දිනයේදී)







සිඳීගිය ජලාශ වල නෙළුම් අල ගලවා
අලෙවි කරන ප්‍රදේශයේ පාසල් දැරියන්




කීර්තිරත්න ගොවි මහතා බිරිඳ හා
දියණියන් සමඟ



**2015.05.29 සිකුරාදා - ලංකාදීප**

## මංගල උළෙලේ මත්පැන් වියදමින් අක්ෂි රෝගීන්ට කාච අරන් දීලා - මනාල යුවළකගෙන් ආදර්ශවත් වැඩක්





මනාල යුවළ අතින් අක්ෂිකාච පිරිනමද්දී



අක්ෂි කාච ලබාගත් පිරිසක්

මෙහි විස්තර පිටු අංක 28 බලන්න...

මුද්‍රණය - ගගන ප්‍රින්ටර්ස් - 0719 850 841